8

# කථකලි නර්තන සම්ප්‍රදායෙහි භාවිත රංගවස්ත්‍ර සහ ශීර්ෂාභරණ


ඩබ්ලිව්. පී. එච්. එම්. වෙද්දෙනිය [1]

HU/2011/1026



කථකලි නර්තන සම්ප්‍රදායෙහි භාවිත වන ප්‍රධාන රංගවස්ත්‍ර සහ ශීර්ෂාභරණ පිළිබඳ විග්‍රහ කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි මූලික අරමුණ වේ. දක්ෂිණ භාරතයේ කේරළය නිජබිම කොටගෙන ප්‍රභවය ලැබූ කථකලි නර්තන සම්ප්‍රදාය සම්භාව්‍ය නෘත්‍ය නාටක සම්ප්‍රදායක් ලෙස සැලකේ. මෙම නර්තන සම්ප්‍රදාය තුළ භාවිතා වන රංගවස්ත්‍ර සහ ශීර්ෂාභරණ එක හා සමාන ලක්ෂණවලින් යුක්ත වුව ද ඒවායෙහි විවිධාකාර වෙනස්කම් දැකගත හැකි ය. මෙම අධ්‍යයනය සඳහා නියැදි ලෙස උපයෝගී කරගන්නේ කේරළයට අයත් කථකලි නෘත්‍ය නාටක සම්ප්‍රදායේ රංග වස්ත්‍ර සහ ශීර්ෂාභරණ පිළිබඳ ව යි. ඒ සඳහා දැනට ලියවී ඇති මූලාශ්‍ර සාධක මෙන්ම ක්ෂේත්‍ර ගවේෂණය මඟින් ලබාගන්නා ලද දත්ත ඉහත අරමුණ විශ්ලේෂණය කිරීම සඳහා උපයෝගී කර ගැනීමට අපේක්ෂිත ය. පර්යේෂණයේදී හඳුනා ගන්නා ලද සාධක හා දත්ත විශ්ලේෂණය කිරීමේ දී කථකලී නෘත්‍ය නාටකය අඩු ආලෝකයක රංග ගත වන අතර එහිදී වස්ත්‍ර සහ ශීර්ෂාභරණ දීප්තිමත් වර්ණ භාවිත කරමින් නිර්මාණය කරගනු ලබයි. ශීර්ෂාභරණ ප්‍රධාන වශයෙන් කොටස් 06 කි. එසේ වුව ද ඒ ඒ චරිත සඳහා මෙම කිරිටම් හෙවත් ශීර්ෂාභරණ භාවිතා කිරීමේදී වර්ණයෙන් වෙනස් වනු ලැබේ. ශීර්ෂාභරණ සහ රංගවස්ත්‍ර නිර්මාණය සඳහා කේරළ ප්‍රදේශයට ම ආවේණික ශාක කොටස්, සත්ව කොටස් හා විවිධ වර්ණ සේද රෙදි භාවිතා කරනු ලබයි. කථකලියෙහි දී මෙම ශීර්ෂාභරණ හා රංගවස්ත්‍රාභරණ නිර්මාණය කිරීම සඳහා මෙන්ම ඒවා නළුවන් සඳහා පැළඳවීමට ද වෙන්වූ කුල පරම්පරා බිහිවී ඇත. මේ අනුව පැහැදිලි වන්නේ කථකලි නර්තන සම්ප්‍රදායෙහි භාවිත වන රංගවස්ත්‍ර සහ ශීර්ෂාභරණ එහි අන්තර්ගත චරිතවල ලක්ෂණයන් උද්දීපනය කිරිමට මනා ලෙස දායකවන බව නිගමනය කළ හැකිය.



ප්‍රමුඛ පදඃ කථකලි, රංගවස්ත්‍ර, ශීර්ෂාභරණ, සම්භාව්‍ය නෘත්‍ය නාටක, චරිත


*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) තෙවන වසර*